// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2449/70 – 2025 අගෝස්තු මස 15 වැනි සිකුරාදා – 2025.08.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39(අ)(1) වැනි වගන්තිය යටතේ නියමය

2012 දෙසැම්බර් මස 19 වැනි දින අංක 1789/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2012 අංක 316 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/12.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය:
WGSWD&EIP/ACQ/MH/02.

2025 ජූලි මස 24 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 526/B ගංගොඩවිල දකුණ B ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගංගොඩවිල (කොට්ඨාස අංක 25 - ගංගොඩවිල දකුණ, මහරගම නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක CO/DSO/2025/14 හා 2025.04.08 අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටස්වලට මායිම් :

01. **කැබලි අක්ෂර ‘B’ – ඉඩමේ නම සොයාගත නොහැක – ප්‍රමාණය: හෙක්. 0.0081**

උතුරට: කැබලි අක්ෂර A; නැගෙනහිරට: කැබලි අක්ෂර C, මු.පි. 3582 හි කැබලි අංක F7 සහ මු. පි. 10197 හි කැබලි අංක 7413; දකුණට: මු. පි. 10197 හි කැබලි අංක 7413 සහ මු. පි. කො. 9572 හි කැබලි අංක 27; බටහිරට: මු. පි. කො. 9572 හි කැබලි අංක 27 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර A.

02. **කැබලි අක්ෂර ‘C’ – ඉඩමේ නම සොයාගත නොහැක – ප්‍රමාණය: හෙක්. 0.0006**

උතුරට: කැබලි අක්ෂර B, A සහ ශ්‍රී ලාල් හික්කඩුව ලියනගේ මාවත; නැගෙනහිරට: ශ්‍රී ලාල් හික්කඩුව ලියනගේ මාවත සහ මු.පි. 3582 හි කැබලි අංක F7; දකුණට: මු.පි. 3582 හි කැබලි අංක F7; බටහිරට: කැබලි අක්ෂර B සහ A.

EOG 08 – 0180